**නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 මැයි 29 දින සභාපති වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ තිබූ වර්ග 07 ක විදුලි උපකරණ වටිනාකම රු. 254,870 ක් මූල්‍ය ප්‍රකාශනවල වියදමක් වශයෙන් පෙන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල තොග වශයෙන් පෙන්විය යුතු වේ. | ඉදිරියේදී අවසන් තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමට කටයුතු කරමි. |
| (ii) | සභාව සතු වාහන 10 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම්වල පෙන්විය යුතු වේ. | ඉදිරි කාලවලදී අදාල වටිනාකම ගිණුම්වල පෙන්වීම සඳහා අවධානය යොමු කර ඇත. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලන රීති 217 හා 218 | ප්‍ර.ස.46 අනුව ඉඩම් සහ ගොඩනැගිලි ලේඛනයක් පවත්වා නොතිබූ අතර ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂාවක් කර නොතිබුණි. | රීති අනුව ක්‍රියාකළ යුතු වේ. | ඉදිරි කාලවලදී වත්කම්වල වටිනාකම සක්සේරු කිරීමට කටයුතු කර අදාල ලේඛනය යාවත්කාලීන කර සත්‍යාක්ෂණ කිරීමට වැඩි අවධායනක් යොමු කරනු ඇත. |
| (ආ) 1993 නොවැම්බර් 18 දින සහ අංක 15 දරන නාගරීක සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය | සභාව විසින් "නාගරික සංවර්ධන" යන නමින් බැංකු ගිණුමක් ආරම්භ කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව බැංකු ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල අධිකාරියේ කටයුතු ආරම්භ කරන අවස්ථාවේදි නාගරීක සංවර්ධනයට අදාල බැංකු ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,628,514 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,684,198 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| කුලී | 2,470,000 | 2,186,666 | 2,230,896 | 1,224,918 | 2,944,500 | 2,819,504 | 3,061,139 | 1,269,148 |
| බලපත්‍ර ගාස්තු | 500,000 | 500,950 | 500,950 | -- | 485,000 | 448,100 | 448,100 | -- |
| වෙනත් ආදායම් | 6,232,500 | 7,714,721 | 8,701,512 | 48,821 | 6,987,500 | 4,456,400 | 5,092,144 | 1,035,611 |
| | **9,202,500** | **10,402,337** | **11,433,358** | **1,273,739** | **10,417,000** | **7,724,004** | **8,601,383** | **2,304,759** |

### 2.2.2 හිඟ මස්කඩ බදුකුලි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2007 සිට 2019 දක්වා වූ කාල පරිච්ඡේදයතුල අයකර ගතයුතු රු.1,163,147 ක හිඟ මස්කඩ බදුකුලි අයකර ගෙන නොතිබුණි. | ඉකුත් වර්ෂයේ හිඟ මුදල සමඟ සමාලෝචිත වර්ෂයේ ආදායමද අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සමථ මණ්ඩලය විසින් බදුකරුවන් ගෙන්වා විමර්ශන කර එහි එකගතාවය අනුව 2019 ජනවාරි මාසය සිට කොටස් වශයෙන් ගෙවමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

### (අ) අත්හැරුනු ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය නොවන සංවිධානයකින් ඉදිකර 2010 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට පවරන ලද රු.මිලියන 03 ක් වටිනා ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සක්‍යතා අධ්‍යයනයකින් තොරව කෝවිලකට නුදුරින් ඉදිකර තිබීම නිසා මහජන විරෝධතා හේතුවෙන් නිෂ්ක්‍රීයව පැවතුනි. තවද, මධ්‍යස්ථාන වටා ගසා තිබූ වැට සහ අළුතින් ලබා දී තිබූ විදුලි සම්බන්ධතාවයට අදාල සවිකිරීම් සොරකම් කර තිබුණි. | අදාල සක්‍යතා අධ්‍යයනයකින් පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වේ. තවද අදාල මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කෙරෙමින් පවතී. |

**(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සභාව විසින් තිරසාර සංවර්ධන සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශක සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉලක්ක මැනීමට දර්ශක සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි වැඩි ආදායමක් උපයා ගැනීම සඳහා සැලැසුම් සභාව විසින් සකස්කර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමේ අදහසින් මිණුම් දර්ශක ඇති කිරීම සඳහා කටයුතු කරන බව දක්වා සිටිම. |
| (ii) 2017, 2018 සහ සමාලෝචිත වර්ෂය සඳහා තිරසාර සංවර්ධන අරමුණ කරා ලඟාවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සභාව විසින් හඳුන්වාගෙන නොතිබුණි. | අදාල ව්‍යාපෘත්තිය ක්‍රියාත්මක කිරීමට මුදල් ප්‍රතිපාදන වෙන් කළ යුතුවේ. | |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ තනතුරු වර්ග 03 ක පුරප්පාඩු 04 ක් පැවතුනි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඔබ විසින් පෙන්වා දැන ලද තනතුරු වර්ග 03 ක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ආ) | 2001 වර්ෂයට පෙර ස්ථාන මාරුවී ඇති සහ විශ්‍රාම ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවියයුතු ණය ශේෂය රු.42,669 ක් කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල අදාල පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට හෝ ගිණුම්වලින් නීතියානුකූලව කපා හැරිමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්තුමා වෙත දන්වා ඉදිරි කටයුතු කිරීම සඳහා උපදෙස් ලබා ගැනීමට කටයුතු කරමි. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 වත්කම් ලේඛනවල ඇතුලත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල එකතු වටිනාකම රු.172,066,147 ක් වුවද, චලනය වන සහ චලනය නොවන වත්කම් ස්ථාවර වත්කම් ලේඛන වල සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ස්ථාවර වත්කම් ලේඛයේ සටහන් කිරීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි වත්කම් තක්සේරු කිරීමට කටයුතු කර අදාල ලේඛන යාවත්කාලීන කර සත්‍යාක්ෂණ කිරීමට කටයුතු කරමි. |

**3.3.2 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ධාවනයෙන් ඉවත් කර තිබුණු Mahendra වාහනය 2012 දෙසැම්බර් සිට අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ ඉවත් කිරීමට හෝ අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | නියොජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු - නැ.ප. මගින් ඉවත් කිරීමට කටයුතු කළ නමුත්, උසාවි ක්‍රියාවලීයක් හේතුවෙන් එය දැනට කළ නොහැකිව තිබුණි. කෙසේ වුවද, උසාවි ක්‍රියාවලියන් නිම වූ පසු සභාවේ මුදල් තත්වය අනුව අළුත්වැඩියා කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. |